ගාස්තු වීම යටිතල පහසුකම් ක්ෂේත්‍රය දිරිගන්වන සුළු උත්ප්‍රේරකයක්.

එක්සත් ජාතීන් මේ අන්තර්ජාතික සමීක්ෂණය ආරම්භ කළේ 2001 වසරේදී. මෙවර නිකුත් කළේ එහි එකළොස් වැනි සමීක්ෂණ වාර්තාව යි. මෙවර වාර්තාවෙන් හෙළි වන කරුණු ලෝකයේ ඩිජිටල් සේවාවන්හි දිරිගන්වනසුළු ප්‍රගතියක් පෙන්නුම් කරන බව එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ ආර්ථික හා සාමාජික සම්බන්ධතා පිළිබඳ අංශ ප්‍රධානි ෂෙන් මින් පවසනවා. ලෝකයේ විවිධ කලාපීය රටවල් සහ නගරවල විද්‍යුත් සහභාගිත්වය, දත්ත කේන්ද්‍රීය ප්‍රවේශයන් හා ඩිජිටල් සේවාවන් වර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති බව ඔහු තවදුරටත් පෙන්වා දෙනවා. ඒ අතර සයිබර් ආරක්ෂාව, දත්තවල රහස්‍යභාවය වැනි අංශවල පවත්නා නව අභියෝග හා අවදානම අවසන් වී නැතත් නව සමාජයක් කරා ගමන් කිරීමේ ඩිජිටල් අනුගතවීම් ජාතික න්‍යාය පත්‍රවල ප්‍රමුඛ තැනක් ගෙන තිබීම වැදගත් බවත් ඔහු පවසන කරුණක්.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන න්‍යාය පත්‍රයේ ද ප්‍රමුඛ තැනක් මීට හිමි ව තිබෙනවා. ජනතා කේන්ද්‍රීය ඩිජිටල් ආණ්ඩු ක්‍රමයක්, ඩිජිටල්කරණය වූ ශ්‍රී ලංකාවක්, තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් යන්න එහි මූලික සංකල්ප යි. ඉදිරි පස් වසර සඳහා වූ මේ ක්‍රියාවලියට මෙය දිරියක් වනු ඇති. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ සභාපති ජයන්ත ද සිල්වා ප්‍රකාශ කරන්නේ "රටේ සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධානතම සාධකයක් ලෙස ඩිජිටල් රාජ්‍යය ක්‍රියාවලිය අද හඳුනාගෙන තිබෙනවා. ඒ සඳහා අපට පැහැදිලි මාර්ගෝපදේශ හා පූර්ණ සහයක් රාජ්‍ය නායකත්වයෙන්ම ලැබී තිබෙනවා. එය වඩාත් සක්‍රිය ලෙස ක්‍රියාවට නැංවීමට ඉදිරියේදී අපට හැකි වේවි. මේ සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ඒ අනුව ප්‍රධාන රාජ්‍ය ආයතන 30ක් මුළුමනින්ම පරිගණකගත කිරීම මඟින් විශාල මට්ටමේ විසඳුම් ලබාදීමටත් තවත් ඩිජිටල් සේවා 50ක් ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබෙනවා. එය ක්‍රියාත්මක වන්නේ සියලු රාජ්‍ය ආයතන හා අන්තර් සබඳතා ගොඩනැගෙන ආකාරයට 2025 වසර ඉලක්ක කරගෙනයි. මේ වනවිට රාජ්‍ය අංශයේ විවිධ ඩිජිටල් සේවාවන් 300ක් පමණ ක්‍රියාත්මක ව පවතින බව ICTA වාර්තාවක සඳහන්.

එක්සත් ජාතීන්ගේ ඩිජිටල් රාජ්‍ය සංවර්ධන වාර්තාව පසුගිය දොළොස් වසර තුළ ඒ ඒ රටවල ඩිජිටල් ක්‍රියාකාරකම් අඩුලුහුඬුකම් සකසා ගැනීමට මඟ පෙන්වන්නෙක් වී සිටිනවා. ප්‍රමුඛතා හා ප්‍රතිපත්ති සකසා ගැනීමට එය ලබා දෙන්නේ සහයක්. එමෙන්ම ඒ ඒ රටවල ඉ - රාජ්‍යය අත්දැකීම් බෙදා ගැනීමට ද මෙය පිටිවහලක්.

එක්සත් ජාතීන්ගේ මහලේකම් 'ඇන්තොනියෝ ගුටරෙස් මේ වසර ගෝලීය සංවර්ධන න්‍යාය පත්‍රයේ පරිවර්තනීය වෙනසක් කරමින් ඉදිරි දස වසරක් තුළ තිරසර සංවර්ධන අරමුණු සඳහා වන උත්සාහයන් ප්‍රකාශයට පත්කොට තිබෙනවා. එහි ඩිජිටල් රාජ්‍ය ප්‍රවර්ධනය, අන්තර්ජාල සේවා පුළුල් කිරීම වැනි සාධක ඔස්සේ සාධාරණ හා කාර්යක්ෂම රාජ්‍යය සේවයක් ශක්තිමත් කිරීම ප්‍රමුඛ අරමුණක්.








